**සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2017 නොවැම්බර් 30 දින පැවැත් වූ සාකච්ඡාවල සාකච්ඡා සටහන්වල ඇමුණුම II හි 12 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණයගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ තෘතීයික රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපකරණ සහ ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම මගින් බෝ නොවන රෝග, විශේෂයෙන්ම හෘද කන්තුකවාහිනී රෝග හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍ය සේවාව වැඩිදියුණු කිරීම සහ එමගින්, ව්‍යාපෘති ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට දායක වීමයි. ණය ගිවිසුම් සහ පවත්වන ලද සාකච්ඡාවල සාකච්ඡා සටහන් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 16,559 කට සමාන වූ ජපන් යෙන් මිලියන 11,352 ක් වන අතර ඉන් රු. මිලියන 15,519 කට සමාන වූ ජපන් යෙන් මිලියන 10,639 ක් මූල්‍යකරණය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ විය. ඉතිරි මුදල වන රු. මිලියන 1,040 මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 20 වන දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝබර් 20 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වයසහඑදිනෙන්අවසන් වූ වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය හාඑහි මුදල් ප්‍රවාහයශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාරාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිඅනුකූලව පිළියෙල කිරීම හාසත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 5 හි 43 (අ) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතියේ විදේශ ණයවලට අදාළව විනිමය ගැලපීම් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමක් සිදු කර නොතිබුණි. | 204 | භාණ්ඩාගාර ආකෘති 33අනුව අදාළ දින වටිනාකමට අදාළව ගණන් තබා ඇත. මෙම ගණන් තැබීම සිදු කරන අවස්ථාවේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය නිකුත් වී නොමැත. භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන අනුව ගෙවීම් දිනට රේටයන් අනුව ගිණුම්ගත කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය. |
| (ආ) | සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් උපදේශක සේවා ආයතනයට ලබා දී තිබුණු කාර්යාල උපකරණ, ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 03 | උපදේශ සේවා ආයතනය සඳහා වෙනම වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. ඉදිරියේදී, උපදේශක ආයතනයේ කාර්යාල උපකරණ ව්‍යාපෘතිවත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතියට අයත් සියලුම වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන තිබුණු ලැබීම් සහ ගෙවීම් ගිණුමේ වටිනාකම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශය සමඟ සසඳා බැලීමේ දී වෙනසක් නිරීක්ෂණය විය. | 33 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ අදාළ ව්‍යාපෘතියේ ගෙවීම් දිනට හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ගිණුම් ගත කළ දිනට පසු දිනකදීය. එම ප්‍රකාශවල යෙන් රේට් අගය ගණනය කරන්නේද, ප්‍රකාශය | අවශ්‍ය ගැලපීම් සිදු කර නිවැරදි ගිණුම් ඉදිරිපත් කළ යුතුය |

නිකුත් කළ දිනයේ වටිනාකමට මිස වියදම් කළ දිනයේ වටිනාකමට නොවේ. මහා භාණ්ඩාගාරයට අනුව ව්‍යාපෘතියේ ගිණුම නිවැරදිය.

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක 507 සහ 756 දරන මූල්‍ය රෙගුලාසි | මුදල් රෙගුලාසියට අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර නොතිබූ අතර ඒවායේ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය, | ව්‍යාපෘතිය විසින් රු. මිලියන 5 කට මිලදී ගත් කාර්යාල උපකරණ සහ සෞඛ්‍ය උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර නොතිබුණි | ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය විගණනය සඳහා ඉදිරියේ දී ඉදිරිපත් කරනු ලැබේ. | නීති රීති අනුගමනය කළ යුතු අතර ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**(අ)**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේකෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | 2022 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| - | ගොඩනැගිලි ඉදිකිරිම | 100 | 30&60 | මෙම ව්‍යාපෘතියේක්‍රියාකාරී සැලැස්මට අනුව, මහා පරිමාණ ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක වන අතර (මෙගා ව්‍යාපෘති), 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව, ව්‍යාපෘති 05 ක ප්‍රගතිය සියයට 30 ක් ලෙසද, එක් ව්‍යාපෘතියක ප්‍රගතිය සියයට 60 ක් ලෙසද, දක්වා තිබුණි. ඒ අනුව ප්‍රගතිය අවම මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ පළමු භාගයේදී ටෙන්ඩරය ලබා දීමට නොහැකි වීම |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | ණය ලබා ගැනීමේ ප්‍රගතිය අඩුවීම ප්‍රධාන හේතුවක් විය. කෙසේ වෙතත්, ණය අත්හිටුවීමකින් තොරව 2022 පළමු භාගයේදී ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හැකි වූයේ නම් ඉදිරි වසරවල ප්‍රගතිය මීට වඩා වැඩි වීමට හැකියාව තිබුණි. |
| **විගණකගේ නිර්දේශයන්** | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගත යුතු අතර ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා ගත යුතුය |

**(ආ)**

| ක්‍රියාකාරකම | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| වෛද්‍ය උපකරණ සපයා ස්ථාපනය කිරීම සමඟ ගොඩනැගිලි ඉදිකිරීම. | මහල් 08, 10 සහ 12 වශයෙන් ව්‍යාපෘති 03ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර වෛද්‍ය උපකරණ සැපයීම සහ සවි කිරීම සමඟින් තවත් ගොඩනැගිලි 03ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය සැලැකීමේදී ජයිකා ආයතනයේ අනුමැතිය සඳහා ගොඩනැගිලි සැලසුම් සහ ටෙන්ඩර් ලේඛන ඉදිරිපත් කර ඇති බව ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබුණි. ඒ අනුව ප්‍රගති වාර්තාවේ දක්වා ඇති භෞතික කාර්ය සාධනය සෑහීමකට පත් විය නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන අදියර අවසන් කිරීමට නොහැකි වීම. | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගත යුතු අතර ව්‍යාපෘතිවල ඉලක්කය සපුරා ගත යුතුය. |